**තේ පර්යේෂණ මණ්ඩලය - 2018**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තේ පර්යේෂණ මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදි විකුණන ලද වාහන දෙකක පිරිවැය වූ රු.828,174 ක මුදල ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත්කර තිබියදී, නැවත එම පිරිවැය ස්ථාවර වත්කම් ගිණුමට බැරකර ප්‍රත්‍යාගණන ගිණුම හරකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ගිණුමේ හා ප්‍රත්‍යාගණන ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ විකුණන ලද වාහන පූර්ණ ලෙස ක්ෂය වූ වාහන වූ අතර ඊට අදාල පිරිවැය සහ සමුච්චිත ක්ෂය ලෙජර් අංක 24 දරණ ස්ථාවර වත්කම් විකුණුම් ගිණුම යටතේ නිවැරදිව දක්වා ඇති නමුත් මෙම වාහන 2014 වර්ෂයේ ප්‍රත්‍යාගණන ක්‍රියාවලියේ දී වාහන විකිණීමේ ලාභය / අලාභය ප්‍රාග්ධන සංචිත ගිණුමට ගලපා ඇත. | වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීමේදී සිදු වී ඇති වරද වත්කම් ඉවත් කිරීමේදී එකවර ගලපා වත්කම්වල ශුද්ධ අගය හා වත්කම් බැහැර කිරීමේ ලාභය/ අලාභය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |
| (ආ) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් හා බාහිර ආයතනවලින් ව්‍යාපෘති සඳහා ලැබී තිබූ රු.56,468,072 ක මුදල ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පෙන්නුම් කරනුවෙනුවට, එම මුදලින් දරන ලද වියදම වූ රු. 26,296,616 ක් අඩුකර ශුද්ධ ප්‍රමාණය වූ රු.30,171,456ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම ලෙස දක්වා තිබුණි. එම නිසා ව්‍යාපෘති සඳහා ලද මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්නුම්කර නොතිබුණි. | 2018 වර්ෂයේ විවිධ ව්‍යාපෘති සඳහා ලද මුදල් සහ එම ව්‍යාපෘති යටතේ කරන ලද ගෙවීම් වෙන් වෙන් වශයෙන් අපගේ ලෙජර් ගිණුම් වල සටහන් වී ඇති නමුත් 2018 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ලැබීම් වලින් ගෙවීම් අඩු කර ශුද්ධ අගය වාර්තා කිරීමේ අඩුපාඩුව 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී ව්‍යාපෘති සඳහා ලැබීම් ගෙවීම් වෙන් වෙන් වශයෙන් පෙන්වීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලාඒම් හා මුදල් ගලායාම් වෙන් වෙන් වශයෙන් පෙන්වීමට කටයුතු කලයුතුය. |

## 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශාන්ත කුම්බස් වතුයායේ ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය (ISO) | 2,381,613 | අයි.එස් ඕ.සහතිකය සහ ඊට අදාල ගෙවීම් විස්තර | ශාන්ත කුම්බස් වත්තේ ISO සහතිකය වර්ෂ 2011න් පසු යාවත්කාලීන කිරීමක් සිදු නොවී ඇති අතර මේ පිළිබඳ අදාල සනාථ කිරීම් ලියකියවිලි සොයා ගැනීමට 2019 වර්ෂයේ දී කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති වත්කම්වල අයිතිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතුය. |
| ශාන්ත කුම්බස් වතුයායේ මුදල් බැංකුගත කිරීම් | 1,251,493 | මුදල් බැංකුගත කිරීමට අදාල වවුචර් 06ක් | ගෙවීම් වවුචර් 56ක් සඳහා රු. 3,762,777 සඳහා ගෙවීම් තහවුරු කිරීමේ ලියවිලි අස්ථාන ගත වී ඇති අතර, ලියකියවිලි සොයා ගැනීමට 2019 වර්ෂයේ දී කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය අතර ගෙවීම්වලට අදාළ මූලික ලියවිලි ආරක්ෂිතව තබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| වැටුප් අත්තිකාරම් | 1,459,000 | ගෙවීම් වවුචර් 11ක් | | |
| විවිධ වියදම් | 1,052,286 | ගෙවීම් වවුචර් 39 ක් | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශාන්ත කුම්බස් වතුයායේ ලැබියයුතු අනියම් සේවක ණය ශේෂ රු. 937,103 ක් හා උත්සව හා විශේෂ අත්තිකාරම් රු.885,877 ක් වසර පහක් ඉක්මවා ඇතත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ශාන්ත කුම්බස් වතුයායට ලැබිය යුතු අනියම් සේවක ණය ශේෂ රු.937,103/- ක් හා උත්සව හා විශේෂ අත්තිකාරම් රු. 885,877/- අයවිය යුතු පුද්ගලයන් හඳුනා ගෙන ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | අදාල පාර්ශව හඳුනාගෙන කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ආ)විශ්ලේෂණ කටයුතු සඳහා අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණු රු.2,941,232 ක මුදල වසර 3 ක් ඉක්මවා ඇතත් එම මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විශ්ලේෂණ කටයුතු සඳහා ලද මුදල් ශේෂයන් නිරවුල් කර විශ්ලේෂණ ආදායම් ලැබීම් ලෙස පෙර වර්ෂයේ ලාභය සඳහා ගැලපීම් කර 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් නිරවුල් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | සේවාවන් සැපයීම සඳහා ලබා ගන්නා ලද අත්තිකාරම් කාර්යය නිමවූ විගස පියවා ගැනීමට කටයුතු කලයුතුය |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික පදනමට වූවත් මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර සහ අංශ ප්‍රධානී තනතුරු 04ක් සඳහා වර්ෂ 3 සිට වර්ෂ 7දක්වා නිත්‍ය පත්වීමක් සිදුනොකර තාවකාලීක වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් කර තිබුණි තවද, අනුමත කාර්යමණ්ඩලය තුල කාර්යභාර නිලධාරී (OIC) තනතුරු නොමැති වුවද එම තනතුරුවල වැඩ බැලීම සඳහා නිළධාරීන් 7 දෙනෙකු පත්කර වැඩ බැලීම දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු.355,483ක් වැයකර තිබුණි. | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර සඳහා කෙනෙකු බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කල ද සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මෙතෙක් එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන නොමැති අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ආදර්ශයට අනුව මෙම තනතුරෙහි සුදුසුකම් සංශෝධනය කර ඇති බැවින් එයට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුණු පසු ඒ අනුව නැවත පුවත්පත් දැන්වීමක් පලකර සුදුසු අයෙකු තෝරාගැනීමට කටයුතු කරන තෙක් මෙම තනතුරෙහි රාජකාරි ඉටු කර ගැනීම සිදු කර ගත යුතුවේ.<br><br>ස්ථානභාර නිලධාරි) OIC) තනතුර තේ පර්යේෂණ ආයතනයට අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැත. එසේ වුව ද තේ පරයේෂණ ආයතනය අධීක්ෂණය යටතේ බොහෝ දුරස්ථ ප්‍රදේශ වල පිහිටා ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන 06ක පරිපාලන හා මුදල්මය කටයුතු ක්‍රමවත්ව කරගෙන යෑම සඳහා එම මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරන ජ්‍යෙෂ්ඨ නිලධාරින් ලවා එම කටයුතු ඉටු කර ගන්නා අතර එම නිලධාරින්ගේ සේවයට අමතරව මෙය ඉටු කරන බැවින් ඒ සඳහා දීමනාවක් තේ පර්යේෂණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවනු ලබයි.<br><br>එසේම මෙම නිලධාරීන් කරනු ලබන කාර්යය අනුව ඔවුන්ගේ වැටුප් වෙනස් වීමකට භාජනය නොකර අංශ ප්‍රධානි - ප්‍රාදේශීය මධ්‍යස්ථාන ලෙස නම් කිරීමට අවශ්‍ය මණ්ඩල පත්‍රිකා (Board Paper) දැනටමත් අනුමැතිය සඳහා යොමු කර ඇත. | ආයතන සංග්‍රාහයේ විධිවිධාන අනුව අනුමැතිය ලබාගෙන අදාළ තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මානව සම්පත් කලමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්ය පටිපාටි අත්පොත සැකසීමට බාහිර පාර්ශවයන් මඟින් මේ වන විට මිල කැඳවුම් ලබා ගෙන ඇත. එය ප්‍රසම්පාදන කමිටුවේ හා තේ පර්යේෂණ මණ්ඩලයේ අනුමැතියන්ට යටත්ව ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර ඇත. | කාර්ය පටිපාටි අත්පොත කඩිනමින් සකස් කර අදාළ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ)2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 5.4.4 මාර්ගොපදේශය | මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තු සඳහා සුරක්ෂණයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට 30 ක උපරිම අත්තිකාරම් ගෙවියහැකි නමුත් ඊට පටහැනිව කන්ටේනර් ප්‍රදර්ශනාගාරයක් සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 50 ක් එනම් රු.670,000 ක් ගෙවාතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවට අදාළව ඉදිරිපත් වී ඇත්තේ එක් ආයතනයක් පමණි. එම ආයතනයද අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් මුදලින් 60%ක් ඉල්ලා ඇත. කෙසේ වුවද මෙවැනි දෑ ඉදිරියේ දී සිදු විමට ඇති ඉඩකඩ අවම කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අනුමත සීමාවක් තුල අත්තිකාරම් ගෙවීමට කටයුතු කලයුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 63,542,018 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,831,737 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 57,710,281ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට 2014 වර්ෂයේදි සිදුකල ප්‍රත්‍යාගණනයන් ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේ දි සිදුකිරීම නිසා වත්කම් වලට අදාල ක්ෂය වර්ෂ 3ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගැලපීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 46 දරන සේවක නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව කිසියම් මාසයක් සඳහා ගෙවිය යුතු වන දායක මුදල් එකී මාසයට පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පෙර ගෙවිය යුතු වුවද එසේ නොකිරීම හේතුවෙන් රු. 146,062 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. | ඉදිරියේදි මෙවැනි ව්‍යවස්ථාපිත ගෙවීම් කටයුතු නිසි කාලය තුල සිදු කිරිමට කටයුතු කරන ලෙස වතු කාර්යාලයට උපදෙස් ලබා දී ඇත. | දායක මුදල් ප්‍රේෂණයට අදාළ නිලධාරීන් තම රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කලයුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශාන්ත කුම්බස් වතුයායේ ගෙවීම් සිදුකිරීමේදී විධිමත් අභ්‍යන්තර පාලනක්‍රම ස්ථාපිතකර නොතිබීම හේතුවෙන් බලයදීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම යන අවස්ථා සහ මුදල් පොත සටහන් කිරීම ,ලෙජරයට සටහන් කිරීම හා බැංකු සැසඳුම පිළියෙලකිරීම යන කාර්යයන් වෙන්වෙන් වශයෙන් පවරා නොතිබුණි.මෙම දුර්වලතාවය නිසා සමාලෝචිත වර්ෂයේදී රු.9,354,332 ක මුදලක් වංචා කර තිබුණු අතර එම වංචා කළ මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කර තිබුණි.මේ සම්බන්ධව දැනට විනය පරීක්ෂණයක් ක්‍රියාත්මක කර ඇති අතර මෙපරිදි වංචා කර ඇති මුදල නිශ්චිතව අනාවරණය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ශාන්ත කුම්බස් වතුයායේ දේශීය තේ අලෙවිහලේ බැංකුගත නොකරන ලද මුදල පිළිබඳව මේ වන විටත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් විමර්ශනයක් සිදු කළ අතර ඒ සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් කරගෙන යන අතරම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටද පැමිණිලි කර ඇත. අනාගතයෙදී මෙවැනි දෑ සිදුවීම වැලැක්වීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරිමට හා ඒ පිළිබඳ පසුවිපරම් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | වගකිව යුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කලයුතු අතර මූල්‍ය පාලනය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කිරීම හා පසුවිපරම් කලයුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තේ වගා කේෂ්ත්‍රයේ පවතින ගැටළුවක් වන පාංශු පුනරුත්ථාපන කාලය අඩුකර ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ 03ක් රු.5,864,487ක් වැය කර පසුව විද්‍යාත්මක උපදේශන කමිටු තීරණ මත අතහැරදමා තිබුණි. | මෙම ව්‍යාපෘති තුළින් පසේ කාබන් ප්‍රමාණය, පාංශු තත්ත්වය හා ජලය රඳා ගැනීම ඉහළ දැමීම සහ වටපණු සහ පෝරියා වැනි රෝගී තත්ත්ව මැඩ පවත්වා ගැනීම පිළිබඳ නිසි ලෙස ප්‍රතිඵල අපේක්ෂා නොවන හෙයින් SAC කමිටුව නවතා දැමීමට උපදෙස් ලබා දුනි. මෙම වියදම් කර ඇති මුදල් ප්‍රමාණයන් ඉහත ව්‍යාපෘති වලට අමතරව SPND අංශ තුළින් සමාන්තරව දියත් කර ඇති උප ක්‍රියකාරකම් සඳහා ද යොදවා ඇත. | තේ වගා ක්ෂේත්‍රයේ පවත්නා දැඩි අවධානය යොමුකල යුතු කාලීන ගැටළුවක් වන බැවින් මණ්ඩලය මෙවැනි පර්යේෂණයන් පිළිබඳ ප්‍රමුඛත්වය ලබාදීමට කටයුතු කලයුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශේෂ ව්‍යාපෘති සඳහා ලැබී තිබුණු මුදලින් රු. 14,030,854ක් වැයකර Walk in Type Environmental Facility නමැති උපකරණය 2018 මැයි 08 දින ඉන්දියාවෙන් ආනයනයකර තිබුණද, එම උපකරණයේ ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමට තිබේද යන්න ඇනවුම් කිරීමට පූර්වයෙන් පරීක්ෂා නොකිරීම හේතුවෙන් මණ්ඩලයට ලැබී වසරක් ගත වුවද, පර්යේෂණ සඳහා භාවිතාකල නොහැකිව නිශ්කාර්යව පැවැතිණි. | මෙම උපකරණය ලංසුවේ එකඟ වූ පිරිවිතරයන් සමඟ නොගැලපීම නිසා එම උපකරණය මේ දක්වා තේ පර්යේෂණ ආයතනය බලාපොරොත්තු වන ප්‍රතිඵලයන්(Performance) ලබා දීමට එම ආයතනය අපොහොසත් වී ඇත. මේ සඳහා නිත්‍යානුකුලව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නීති නිලධාරිතුමිය වෙත යොමුකර ඇත. | උපකරණයේ ක්‍රියාකාරීත්වය මණ්ඩලය අපේක්ෂිත මට්ටමට පවතීද යන්න ඇනවුම් කිරීමට පූර්වයෙන් පරීක්ෂා කළ යුතු අතර මේ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නුවරඑළියේ තේ අලෙවිසලක් ආරම්භ කිරීම සඳහා පිරිසැකසුම්කරන ලද කන්ටේනර් ප්‍රදර්ශනාගාරයක්, සෙප්ටික්ටැංකියක් සහිත වැසිකිළියක් සපයා සවිකිරීම සඳහා 2018 පෙබරවාරි 26 දින රු.670,000 ක් ගෙවාතිබුණද එම කාර්යය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවසන්කර නොතිබුණි. | මෙම තේ අලෙවි සැල ආරම්භ කිරීම සඳහා නිසි කලට අදාල ඉඩම් කොටස නිදහස් කර ගැනීමට නොහැකි වූ බැවින් තේ පර්යේෂණ මණ්ඩලයේ තීරණය පරිදි මෙම වැය වූ මුදල නැවත ලබා ගැනීම සඳහා අදාල පිරිසැකසුම් කරන ලද කන්ටේනරය වෙන්දේසි කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් (TEC) පත් කර එහි නිර්දේශය පරිදි දෙපාර්තමේන්තු ප්‍රතිපාදන කමිටුවක් (DPC) පත් කර අදාළ කටයුතු සිදු කර ගෙන යනු ලැබේ. | ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනයන් සිදුකිරීමට පෙර ඒවා ඉටුකිරීමේ ශක්‍යතාවයන් පිලිබඳ සැලකිලිමත්ව කටයුතු කලයුතුය. |
| (ආ) තේ වගාව කඳ විදින ගුල්ලාගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා රු. 5,513,743 ක් වැය කර ක්‍රියාත්මක කරන ලද Development of cost effective control methods for integrated Management පර්යේෂණයට අවශ්‍ය රසායනික ද්‍රව්‍යයක් ලබා ගැනීමට නොහැකි වීම මත එම පර්යේෂණය 2017 වර්ෂයේ සිට නවතා දමා තිබුණි. | මෙම A22 යන Thrust යටතේ ව්‍යාපෘති 03ක් දියත් කෙරේ. ඒවා නම්, A 22.1, A 22.2 සහ A 22.6 වේ. A 22.1 තුළ ක්‍රියාකාරකම් සිදු නොවුන ද 2017 හා 2018 වර්ෂයන් තුළ ව්‍යාපෘති 02ක් (A 22.2 හා A 22.6) දියත් කරන ලදි. | පර්යේෂණය නැවත ආරම්භ කිරීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කලයුතුය. |
| (ඇ) 2003 වර්ෂයේ දී ආරම්භ කරන ලද එල්ටීපී ව්‍යාපෘතිය සඳහා රු.4,142,173 ක් වියදම් කිරීමෙන් පසුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. | LTP ව්‍යාපෘතියට අදාල ගිණුම් ශේෂය ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අමාත්‍යාංශයෙන් අවස්ථා කිහිපයක දීම ඉල්ලීම් කර ඇති අතර 2019 ජනවාරි 08 දින අමාත්‍යාංශය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති අතර එම අවසරය ලැබුණු පසු අදාල ගිණුම් ශේෂය ගිණුම් වලින් ඉවත් කිරිමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘතිය සඳහා වියදම් දැරීමට ප්‍රථම අදාළ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කල යුතුය. |